





ධර්මකාමී පින්වතුනි,

අද ක්‍රිස්තුවර්ෂ 2013 වසරේ මාර්තු මසට යෙදුනු මැදින් පුර පසළොස්වක පොහොය දිනයයි. තමන් වහන්සේගේ ගමනින් වන මහා අභිවෘද්ධිය දැක, අංග, මගධ, දෙරටින් පැවිදිව රහත්වූ දස දහසක් ද, කිඹුල්වතින් පැමිණ පැවිදි වූ දසදහසක් ද වූ විසි දහසක් රහතුන් වහන්සේලා පිරිවරා භාග්‍යවතුන් වහන්සේ කිඹුල්වත බලා පිටත් වූයේ අද වැනි මැදින් පුරපසළොස්වක දිනක දීය.

අද සද්ධර්ම පණිවුඩයට මාතෘකා කරගත්තේ සූත්‍ර පිටකයේ මැදුම් සඟියෙහි මූලපරියාය වගගයේ 07 වෙනි සූත්‍රය වන වත්ථූපම සූත්‍රයයි. භාග්‍යවතුන් වහන්සේ මෙම දේශනාව සිදු කරන්නේ සැවැත්නුවර ජේතවනාරාමයේ වැඩ වසන සමයේදී ය. මෙම දේශනාව අපේ සිත අකුසල ධර්මවලින් කිළිටි වනහැටි සහ එයින් පිරිසිදුවන ආකාරය කියාදීමට දේශනා කරන ලද්දකි. මේ සඳහා භාග්‍යවතුන් වහන්සේ ඉතා ලස්සන ගැළපෙන උපමාවක් භාවිතා කරනව. එනම්, කිළිටි වූ වස්ත්‍රයක් සඳහා සායම් පෙවීමක් සම්බන්ධවයි.

පින්වත් මහණෙනි, තම රැකියාව සඳහා රෙදිසෝදන එමෙන්ම රෙදිවලට සායම් පොවන මනුෂ්‍යයෙක් වස්ත්‍රයකට සායම් පෙවීම සඳහා සායම් භාජනයකට ඔබනව නැවත පිටතට ගෙන බලන විට නිසි පරිදි නිසි වර්ණය ඒ වස්ත්‍රයේ රැඳිලා නැහැ. ඊට හේතුව මේ වස්ත්‍රය සෝදලානැති අපිරිසිදු වස්ත්‍රයක් නිසාය. නැවත පිරිසිදු වූ සේදූ වස්ත්‍රයක් සායම් භාජනයට ඔබනව දිග හැර බලද්දී මේ වස්ත්‍රයට හොඳට නියමිත වර්ණය. රැඳිලා ප්‍රභාස්වරව පෙනෙනව. පළමු කී වස්ත්‍රයට සායම් ඇල්ලුවේ නැත්තේද දෙවෙනිව කී වස්ත්‍රයට සායම් නිසි පරිදි ඇල්ලුවේද , එම වස්ත්‍ර පිරිසිදු නොකරනලද සහ පිරිසිදු කරන ලද වෙනස නිසා ය. එපරිද්දෙන්ම මහණෙනි, ලෝක සත්වයාගේ සිත ද අපිරිසිදු වුනොත් මරණින් මතු දුගතිය ද, පිරිසිදු වුනොත් සුගතිය ද, කැමති විය යුතුමය.ඊළඟට භාග්‍යවතුන් වහන්සේ දේශනා කරනව. කතමෙච භික්ඛවෙ චිතතසස උපකකිලෙසා? පින්වත් මහණෙනි, මොනවායින් ද සිත කිලිටි වන්නේ?

අභිජකධා විසමලොභො චිතතසස උපකකිලෙසො තමන් සතු දේ ගැනත් අනුන්සතු දේ ගැනත් ලෝභකම ඇතිවීම නිසා තමන්ගේ සිත කිළිටිවේ දේශණාවේ හැටියට තමන් සහ අනුන් සතු දේ පිළිබඳව ඇතිවන බලවත් ආශාවයි (ඡන්දරාගය). ලෝභය තමන්ගේ සහ අනුන්ගේ අනර්ථය ළඟාකරදීම ද, සිත කෝප කිරීම ද  බියට ද හේතු වේ. අකුසල් මහා මුල් තුනෙන් එකකි. දුක ඇතිවීමට හේතුව දේශනා කරන සමුදය ආයර්‍ය දේශණයේ තෘෂ්ණාව වශයෙන් වදාළේ ද මෙම විෂම ලෝභයයි. මෙයින් කිළිටි වූ සිත මරණින් මතු දුගතියට පමුණුවයි.

බ්‍යාපාදො චිතතසස උපකකිලෙසො කේන්ති යෑමෙන් හිත කිළිටි කරගැනීම තරහ ඇතිවීම ව්‍යාපාදයයි. කෙටියෙන් කියන්නේ නම් මෛත්‍රියෙහි විරුද්ධ පැත්තයි. ක්‍ෂාන්තිය සිතෙන් පලාගොස් අනුන් නැසේවා ආදී චේතනාවන් සිත තුළ පහළවීමයි. ඒ තුළින් සිත කිළිටි වීමයි.

කොධො  චිතතසස උපකකිලෙසො ක්‍රෝධය යනු ලෝකයා රිදවීමට හිතට ඇතිකරගන්නා ද්වේශයයි. පළමුවෙන් සිත තුළ ඉතා සුළුවෙන් හටගෙන ක්‍රමයෙන් වැඩී අනුන් හා තමන් ද විනාශ වන්නා වූ අකුසල සිතුවිල්ලකි ක්‍රෝධය උමතුවකි. තමාගේම වස්තුව විනාශකරයි.

අඹුදරුවන්ට වධහිංසා කරයි. දෙමාපිය ගුරුවරාදීන්ට වධ හිංසාකරයි. එබැවින්ම ක්‍රෝධය ආ විගස තම නිවසට ඇතුළු වූ සර්පයකුසේ ද කුසයට ඇතුළු වූ වසවිෂ සේ සළකා දුරුකිරීමට උත්සාහ කළ යුතුය. එසේ නොවුවහොත් එයින් ඔහුට මෙලොවද මරණින් මතු ද දුකට පත්වීමට හේතුවේ.

උපනාහො චිතතසස උපකකිලෙසො මේ පරණ වූ නැවත නැවත පැවැත් වූ ක්‍රෝධයේ ස්වභාවය යි. දීර්ඝ කාලයක් ක්‍රෝධකර ඇතැම්විට එක් ජාතියකදී කෙළවර නොවී භවාන්තර ගත වී කාලියකින්න, දේවදත්ත, ආදීන්ට මෙන් මහා වෛරයක් බවට පත් වී අවීචිමහා නිරයේ ඉපදීමට ද හේතු වේ.

මකෙඛා චිතතසස උපකකිලෙසො අනුන් විසින් තමන්ට කළ, ගුණ අමතක කිරීමයි. ගුණ මකා දැමීමයි. මාපිය ගුරුවර ඥාතිමිත්‍රාදීන්ගෙන් උපකාරලබා දියුණුවූ පසු ''මගේ වීයර්යෙන් දියුණු වූවා මිස මට කවුරුන්වත් කළ දෙයක් නැත...'' යයි කළ ගුණ මකා දමති. මෙවැන්නෝ ඇතැම් විට මෙලොවදීම නැවත පිරිහී නපුරු අනතුරු උවදුරු රෝග වැළඳී බොහෝ කල් දුක් විඳ කායික ආර්ථික මානසිකව පිරිහී මියයයි. වර්තමානයේ ද, මේ සත්‍ය සමාජය දෙස විමසිල්ලේ බලා තේරුම් ගත හැකිය.

පලාසො චිතතසස උපකකිලෙසො ගුණවන්තයින් හා තමා සම කොට ''මගෙත් ඔහුගෙත් වෙනස කුමක්දැ'' යි හිතා යුගග්‍රාහීව ගෙන ගරුකළ යුත්තාට ගරු නොකොට කීකරු විය. යුත්තන්ට කීකරු නොවී ගුරු උපදෙස් ගත යුත්තන්ගෙන් ගුරුකම් නොගෙන නූගත් ගුණවත්නො වූ තමා උගතුන් හා ගුණවතුන් සමග සමව සිතා දෙලොවින්ම පිරිහේ.

ඉසසා චිතතසස උපකකිලෙසො අනුන්ගේ සම්පත් නොරුස්නාගතියයි. අනුන් ලබන ඇඳුම් පැළඳුම් ගේ දොර, කුඹුරු, වතුපිටි, තනතුරු, පූජා සත්කාර, නොඉවසීමයි. ඒවා නැති කිරීමට නිතරමාන බලයි. ඒවා කවදා විනාශ වේදෙයි බලා සිටී. නැතිවූ අවස්ථාවේදී ඉමහත් සතුටක් ලබයි. එසේ නොවුවහොත් අනුන්ගේ සම්පතෙහි දොසක් ඇදයක් දැක '' ඕක එතරම් වටිනා දෙයක්

නෙවී''යයි කියාහෝ සැනසේ මේ තත්වය ගිහියන්ට ගිහියන් ගැනත්, පැවිද්දන්ට පැවිද්දන් ගැනත් ආදී වශයෙන් විශේෂ වේ. අනෙක් ආකාරයේ පාපයක් කළොත් ඔහුට මෙලොව අයුතු වූ හෝ ලාභයක් සුවයක් දැනේ. ඊෂර්‍යා කරන්නාට ඉන්වන අයුතු වූ හෝ වාසියක් හෝ යහපතක් දෙලොවටම නැත බොහෝ සතුරෝද ඔහුට ඇතිවේ. සමාජය අප්‍රිය කරයි.

මච්ඡරියං චිතතසස උපකකිලෙසො මසුරුකම සිත කිළිටි කරයි. තමන් සතුදේ අනුන්ට හිමිවීම එයින් ප්‍රයෝජන ගැනීම දැකීමටත් අකමැති ගතියයි. මසුරා අනුන්ට තමාගේ දේ දෙන්න තියා අනුන් දකිනවාටත් අකමැති වේ. මසුරා ලෝභියා යනු දෙදෙනෙකි. මසුරා මසුරු කමට නොදේ. ලෝභියා ලෝභකම නිසා නොදේ. මසුරා වෙනත් කෙනෙකුගේ දීම ද වළක්වයි. දොස්කියති. ඔහු ලබන්නාගේ ලැබීම් ලාභයද, දායකයාගේ දීමෙන් වන පුණ්‍ය ලාභයද, නැති කරයි. ඔවුන් මරණින් මතු නිරයේ හෝ ප්‍රේතව උපදී.

මායා චිතතසස උපකකිලෙසො තමන් ළඟ අගුණ දොස් තබාගෙන අකුසල් කරමින් ඒවා සඟවාගෙන ගුණවන්තයන් ලෙසට පෙනී සිට ලෝකයා රැවටීමයි. සංවරකම පෙන්වති. එනමුත් දුස්සීලවෙති. සිල්වතුන් ඇතිකරන්න කථා කරති. වත්පිළිවෙත් කරති. ඒවායේ ආදීනව කියති.නමුත් ඔහු ළඟ මේ ගුණ නැත. මෙයින් ලෝකයා රැවටෙති. එවැනි සිත් ඇත්තෝ කිළිටි සිත් ඇත්තෝ ය. ඔවුන් මරණින් මතු දුගතියේ උපදී.

සාඨෙය්‍යං චිතතසස උපකකිලෙසො මෙම ලකෂණයෙන් යුතු සිතක් ඇත්තා බොරු මෛත්‍රිය කරුණාව, හිතවත්කම්, නෑකම්, මිතුරුකම් දක්වමින් අනුන් රවටා ලාභ සත්කාර ලබා ගනී. නැති හිතවත් ගතියක් ඇතිලෙස දක්වා ලෝකය රවටයි. ඇතැමුන් බුද්ධ ශාසනයෙහි ධ්‍යානාභිඥා, මාර්ග ඵල යන උත්තරීතර මනුෂ්‍ය ධර්මයන් තමාතුළ නැතිව ඇතැයි කීමට ද, පෙළඹේ. එය මේ වර්ගයේ ඉතාම බරපතල නපුරු පාපයකි. ඔහු දෙවියන්, බ්‍රහ්මයින්, මාරයින්, ශ්‍රමණ බ්‍රාහ්මණයින්, මනුෂ්‍යයින් සහිත සත්ව සමූහයෙහි මහාසොරා ලෙසට භාග්‍යවතුන් වහන්සේ වදාරා ඇත.

ථම්භො චිත්තස්ස උපක්කිලෙසො මෙම කිලුට වන්නේ යුක්තියට, ධර්මයට මාපිය ගුරුවරාදීන්ට නැමිය යුතු තැනැත්තාට නොනැමෙන තද ගතියයි. දරදඬු කමයි. කීකරුකම දැක්විය යුත්තාට එවැනි අවස්ථාවට කීකරු කම දැක්විය යුතුය. එසේ නොවන්නා දෙලොවම පිරිහේ. සෑමතැනකදීම නැමීමට මෙයින් නොකිය වේ. එය ද පිරිහීමකි.

සාරම්භොචිත්තස්ස උපක්කිලෙසො  තරඟයට වැඩකරන ගතියක් යම් සිතක් තුළ පැවතීමයි. අනුන් යටපත්කිරීමක් අනුන්ට ඉහළින් කළා යයි කීමට වැඩකරන ගතියයි. එකට එක හෝ ඊට වැඩියෙන් කිරීමය. පින්දහම් කරන්න ගියත් මෙවැන්නෝ තරඟ කරති. අනුන් එක වචනයකින් බැන්නොත් අපහාස කළොත් ඔහු දෙතුන් ගුණයකින් වැඩි කරයි. මේ ආකාරයට හැම දේකදීම අනුන් යටපත් කිරීමට තමා ඉහළින් සිටීමට වෙර දරයි. වඩා හොඳ වන්නේ කළ යුත්ත හොඳින් කිරීමයි.

මානො චිත්තස්ස උපක්කිලෙසො මෙය අහංකාරකම ඇති සිතක ස්වභාවයයි. මෙය උගත්කමින්, කුළයෙන්, ධනයෙන්, රූපයෙන් ආදී සම්පත්තීන්ගෙන් තමන් උසස් යයි තමන් විසින්ම මැන හිත පැවැත්වීමයි. එම මානය හැමතැනකදීම අනුන් තැලීමට පෙළීමට භාවිතා කරති.  මානය විවිධාකාරයෙන් වෙනස්වෙමින් සිත්තුළ ඇතිවේ. එය ද සිතට කිලුටකි. මරණින්මතු වඳුරන් ආදී තිරිසන් සතුන් වී ඉපදීමට හේතු වේ. මානෙන මක්කටොහොති

අතිමානො චිත්තස්ස උපක්කිලෙසො ඉහත මානය පිළිබඳව කී ධනවත්කම් පණ්ඩිතකම්, කුලවත්කම් ආදියේ ආනුභාවයෙන් අනුග්‍රහයෙන් සාමාන්‍ය මානය දළුලා බලවත් වී අනිකාට කුමක් කළ හැකි ද? කුමක් තිබේ ද? කුමක් දනී ද? යනාදී වශයෙන් අනුන් පහත්කොට තමා කොඩියක් මෙන් කොතක් මෙන් චුඩාමාණික්‍යයක් මෙන් උසස්කොට ගත් කෙනාට බලවත් වූ මානයක් ඇතිවේ. එයට අති මානයයි කියනු ලැබේ. එවැනි සිතක් එයින් කිළිටි වී මරණින් මතු සුනඛ ආදී තිරිසන් ගත උප්පත්ති ලබති. අතිමානෙන කුක්කුරො

මදෙ චිතතසස උපකකිලෙසො මදය යනු මත් වීමය. උගත්, කුලවත්, ධනවත්, බලවත්කම් ආදියෙන් උඩඟු වීමෙන් ඇතිවන මත්වීම, මුලාවීමට මදය යනුවෙන් හඳුන්වයි. සුරාවෙන් මත්වූවෝ කළ යුත්ත නොකළයුත්ත තෝරා බේරානොගෙන. නොකළ යුක්ත කොට දෙලොවම පිරිහෙන්නා මෙන් මොවුන් ද දෙලොව පිරිහේ. සුරා මදය පවතින්නේ එහි සැර හෙවත් "සූර්" එක පවතින පැය කීපයකි. එහි ආදීනවය පමණක් සසරටම බලපානු ඇත. නමුත් කුල ධන ආදියෙන් මත්වූවෝ වසර ගණන් හෝ මරණය තෙක් එයින් මත්වී සසරට ද පවතින බැවින් මහා අනර්ථයකි.

පමාදෙ චිතතසස උපකකිලෙසො සාමාන්‍ය ව්‍යවහාරයේදී ප්‍රමාදය කියා හඳුන්වන්නේ යම්කිසි ක්‍රියාවක් කළ යුතු අවස්ථාවේදී නොකිරීම හැඟවීමටයි. මෙහි "පමාද" යනුවෙන් හඳුන්වන්නේ අකුශල ධර්ම රාශියටම ය. පංචකාමයට නැමී තිබෙන සිත නිතරම පවතින්නේ පංචකාම විඳීමට සහ දුසිරිතට නැමීගෙනය. සුසිරිතය පවතින්නේ සිහි නුවනෙහි බලයෙනි. සිහිය නැමැති වර පටෙන් මිදුනු වහාම නැවත පංච කාමයට සහ දුසිරිතට නැමේ. එබැවින් සිහිය නැමැති රැහැන අප්පමාද නම් වේ. ප්‍රමාදය මරණයට හෙවත් ජාති මරණාදී දුක් සහිත සසර ගමනට හේතු වේ. අප්පමාදය අමෘතය හෙවත් අමරණීයත්වයට නිවනට හේතු වේ. නුවණ නැත්තා ප්‍රමාදයේ යෙදෙති. නුවණ ඇත්තා අප්‍රමාදවී එය ශ්‍රේෂ්ඨ ධනයක් මෙන් ආරක්‍ෂා කරයි.

මෙසේ සිත කිළිටිකරන ඒ. ඒ. කරුණු වෙන වෙනම වදාළ භාග්‍යවතුන් වහන්සේ යමෙක් හිතෙහි විශුද්ධිය ඇතිකරගන්නා ආකාරය පැහැදිලි කරනව. එකින් එක එම උපකෙලශ සිත කිලුටු කරන බව නුවණින් දැක ඒ ඒ කාරණයෙන් සිත කිළිටි කරන උපකෙලශ එක එක දුරුවීමට පත්කරන බව වදාරා එයින්ම ත්‍රිවිධ රත්නයේ ගුණ දැන අචල ප්‍රසාදයට පත්වී ඔහු සොවාන් තත්වයට හෙවත් පළමු සංයෝජන ධර්ම තුන ප්‍රහීන කොට පිළිවෙලින් ඉතිරි මාර්ගඥාණ උපදවා සතරඕඝ තරණය කොට අර්හත්වය පිණිස කළ යුතු තව යමක් නැතැයි සිය නුවණින්ම වටහා ගන්නව. සේදූ වස්ත්‍රයක් මෙන්ද උණුවී උදුනේ මුව විටට පැමිණි බබළන රත්‍රන්මෙන් සිත පිරිසිදු වී ලැබූ මාර්ග ඵල අනුව උපේක්‍ෂාවෙන් මැදහත්ව වාසය

කරන බව සූත්‍රයෙන් පැහැදිලි කරනව. එමෙන්ම, ඇතුළත නා පිරිසිදු වීමකටද, උපමා කරනව.

මේ දේශණාව අසමින් සිටි තම පිළිවෙත වශයෙන් ගඟට බැස එම ජලයෙන් බාහිර ශරීරය සෝදා පවු සේදීම කරන සුන්දරික භාරද්වාජ නම් බමුණාගේ එම වැරදි දෘශ්ඨියද, ඒ අමා ජලයෙන් සෝදා නිවන් දැක් වූ බවද සූත්‍රයේ අවසානයේ දැක්වේ. මෙම වත්ථූපම සූත්‍රයෙන් අපේ සිතේ හටගන්නා අකුසල ධර්‍ම වෙන වෙනම පැහැදිලි කිරීම පමණක් නෙවි. එයින් මිදෙන ආකාරය වස්ත්‍ර උපමාවෙන් භාග්‍යවතුන් වහන්සේ පැහැදිලි කරනව.

අකුසල ධර්‍ම අපේ සිතේ හටගන්නා ආකාරය ''අකුසල සමාපත්ති'' නම් සූත්‍රයෙන් වඩාත් පැහැදිලි කරපු ආකාරය මෙතැනදී පෙන්වාදීම උචිත සේ හැඟින. එම සූත්‍රයේදී අපුරු හේතු 05 ක් හේතු වශයෙන් පෙන්වනව.

01. ශ්‍රද්ධාව නැතිකම .
02. පවට ලජ්ජා නැතිකම
03. පවට භය නැතිකම
04. වීර්‍ය්‍ය නැතිකම
05. ප්‍රඥාව නැතිකම වශයෙනි.

මේ කරුණු 05 යමෙකුගේ සිතෙහි පහළවේද? එවිට ඔහුගේ සිත තුළ සිත කිළිටි කරන අකුසල් වැඩේ. යමෙකුගේ සිත තුළ ඉහත කී කරුනු තුළින් කියවෙන යහපත් පැත්ත එනම්, ශ්‍රද්ධාව ඇතිවේ ද (ත්‍රිවිධ රත්නයේ ගුණ දැන) ලජ්ජා, භය ඇතිවේද වීර්‍ය්‍ය සහ ප්‍රඥාව ඇතිවේද?, ඔහුගේ සිත පිරිසිදු වන කුසල ධර්‍ම උත්පාදනය වේ. නීවරණ බරින් නිදහස් වේ. යනුවෙන් වදාරා ඇත.

අද ලෝකයේ ජීවත් වන බොහෝ මනුෂ්‍යයින්ට නිතර සිදු වන්නේ ඉහත කී කුසල් වැඩෙන කරුනු පහ වෙනුවට අකුසල් වැඩෙන කරුනු පහ ක්‍රියාත්මක වීමයි. තමාගේ සිතින්ම දැකිය යුතු හේතු ඵලයන්ගෙන් යුතු දහමක් දෙසූ ඒ ශාස්තෲවරයා පිළිබඳ හෝ ඒ දහම පිළිබඳව හෝ එයින් අමා සුවයට පත් ආර්‍ය්‍ය උතුමන් පිළිබඳව

හෝ ගුණ නොදැන ශ්‍රද්ධා ලජ්ජා, භය, වීර්‍ය්‍ය, ප්‍රඥා, යන ගුණ හීන වීමෙන් සත්‍ය මාර්ගය වැසී ඇත. එයින්අබුද්ධෝත්පාද කාලයක ඇරඹුමක සේයාව වැටෙමින් ඇත. මාරයාගේ ග්‍රහණයට සියළු දෙනාම සියුම් ලෙස නතු කර ගෙන ඇති බව කිසිවෙකු නොදනී. ඒ මාරයාගේ අභිමතාර්ථයේ සේයාවය. මිනිස් සිතේ තෘෂ්ණාවේ බලවත් භාවය නිසාම ඇති වූ පාරිසරික විනාශයන් හේතුවෙන්ම ධර්මයේ සන්දිට්ඨික ගුණය දරා ගැනීමේ රැකගැනීමේ ශක්තිය හීන වී ඇත. වත්ථූපම සූත්‍රයේ දැක්වෙන පිරිදි ධර්මයේ අර්ථය මතුකිරීමට අප ජීවිතයට එකතු කරගත යුතු සූත්‍රයේ සඳහන් අවසන් උපක්ලේශය වන ''ප්‍රමාදය'' දුරුකොට ''අප්‍රමාදය'' කියන වචනය ගැන සැලකිලිමත් වුවහොත් මාරයා පෙන්වන මෝස්තරයට තෙරුවන් සරණ යෑම දන්දීම, බණ ඇසීම, වැනි ලකුණු ලබා ගැනීමේ මානසිකත්වයෙන් මිදීමට මග පෑදේ. මේ වන විට ඇතැමුන් මදුරුවෙකුට තිබෙන බිය තරම්වත් බයක් නැති සසර බිය නැවත සැබෑවට ඇති කරගත හැකි බැවින් ''උපපනනානං ධමමානං පහානාය'' උපන්නා වූ පාපී අකුසල දහම් ප්‍රහාණය කිරීම පිණිස ඡන්දං ජනෙති කැමැත්ත තිබිය යුතුය. වායමති වෑයම් කිරීම ද, විරියං ආරභති වීර්‍ය්‍යාරම්භ කිරීම ද, චිතතං පගගණහාති සිත දිරිමත් කිරීම ද, පදහති බලවත් උත්සාහ කිරීම ද, කළ යුතු යයි. එම සචච විභඞග සූත්‍රයේදී දෙන ලද අවවාදයද නිතර සිහිකොට වත්ථූපම සූත්‍රයට අනුව දුක් දුරුකිරීමට වීර්‍ය්‍ය වැඩිය යුතුය.